1 - B

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර අධිපන්තිය (ශිල්ප ප්‍රදර්ශක) සඳහා වන
බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව — යොමු අංකය : DTET/04/23/D/I — දිනය : 2012.07.17

1.2 අමාත්‍යාංශය : යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය — යොමු අංකය : 2/1/17/1/4/2 — දිනය : 2012.06.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම — යොමු අංකය : DMS/DTET/6/6/(C) — දිනය : 2005.01.26
යොමු අංකය : DMC/5/46 DMS/C/5/46/Vol I — දිනය : 2012.07.05 2013.06.04

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය : EST-2/RECRU/03/2002 — දිනය : 2012.01.18

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය : NSCC/1/44/1/SR-1 — දිනය : 2011.12.07

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය — යොමු අංකය : PSC/EST/3/1/77/2012 — දිනය : 2012-10-09

02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර අධිපන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : අනුමත තනතුරු සංඛ්‍යාවට සීමාවන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්ය භාරයට පරිපූරක / සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන / පිරිස් කළමනාකරණය සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

04. තනතුරේ ස්වභාවය : ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතයි.

05. වැටුප්

5.1.1 වැටුප් කේත අංකය : MN – 7 – 2006 (ඒ)

වැටුප් පරිමාණය : රු. 20,030 – 11 x 365 – 18 x 500 – 33,045/-

රා. සේ. කො. ස. ලේකම්ගේ අංක PSC/EST/3/1/77/2012 හා 2013.10.28 දිනැති ලිපියෙන් දක්ෂ සුදුම පරිදි මෙම බඳවා ගැනීමේ පරිපාටියේ අංක 1.3, 6.1 හා 6.2 සංශෝධනය කිරීම සඳහා 2013.10.22 දින රා. සේ. කො. සභා අනුමැතිය ඒ අනුව අදාළ සංශෝධන අනුමැතිකර ඇත.

5.1.2 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	වැටුප් තලය (රු.)
විශේෂ	3 පියවර	රු 20,760/-

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

අනුමත තනතුරු නාම	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
ශිල්ප ප්‍රදර්ශක අධිපන්තිය	18 38	වැඩහල්වල ශිෂ්‍ය ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලදී ජ්‍යෙෂ්ඨ උපදේශකවරයාට / උපදේශකවරයාට සහාය වීම සහ එකීකර්මාන්ත ශාලාවල ආචාර්යවරයා නිවාඩු ලබාගෙන ඇති අවස්ථාවලදී හෝ දේශීය හෝ විදේශීය පුහුණුවකට සහභාගී වන අවස්ථාවක හෝ වැඩපළේ භාරකාරත්වය මෙම අධිපන්තියේ ශිල්ප ප්‍රදර්ශකට පැවරේ. කර්මාන්ත ශාලා විධිමත්ව පවත්වාගෙන ඒමට සහායවීම සහ විද්‍යාලයේ පොදු නඩත්තු කටයුතු සඳහා සහාය වීම / I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ ශිල්ප ප්‍රදර්ශකවරුන් සහ පුහුණු කාර්මිකයින්ගේ වැඩ අධීක්ෂණය කිරීම උක්ත ශිල්ප ප්‍රදර්ශක සහ පුහුණු කාර්මිකයින්ගේ කාර්යක්ෂමතාව හා වැඩඵලදායිතාවයක් ලබාගැනීම කරා මෙහෙය වීම. තනතුරට අදාලව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශිල්ප ප්‍රදර්ශක අධිපන්තිය - 18 38

කාර්යාල නිලධාරී 09
කාර්යාල නිලධාරී 29
38

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

ධාරාව	ප්‍රතිශතය
විවෘත	අදාල නොවේ.
සීමිත	අදාල නොවේ.
කුසලතා	100%

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ.

7.4 කුසලතාව මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.4.2.3 පළපුරුද්ද : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශිල්ප ප්‍රදර්ශක තනතුරේ 1 ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියකු වියයුතුය.

II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත වියයුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. අයදුම්පත් කැඳවීමේ දිනට පුර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

V. I ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම

7.4.3 වයස : අදාල නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.4.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ.

7.4.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.4.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය ඇමුණුම 01 හි සඳහන් වේ.

7.4.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීමක් පලකිරීම හෝ වෙබ් අඩවියේ පළකිරීම මගින්

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාල නොවේ.

09. රාජ්‍ය භාෂා ප්‍රවීනතාව :

ශ්‍රේණිය	ලබාගත යුතු ප්‍රවීණතාවය
1. රාජ්‍ය භාෂාව	අදාල නොවේ
2. අනෙක් රාජ්‍ය භාෂාව	අදාල නොවේ

10. ශ්‍රේණි උසස් කිරීම : අදාල නොවේ.

11. තනතුරවලට පත් කිරීම : අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : සක්‍රීය සේවා කාලය යනු : ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය : අදාල නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන .....

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : පී. කේ. සරත්චන්ද්‍ර, පරිපාලන නිලධාරී, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ - 10.

තනතුර :

දිනය : 2012/10/25

පරීක්ෂා කළේ : අත්සන .....

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : බී. පී. සී. කුලරත්න, අධ්‍යක්ෂ (පරිපාලන), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ඕල්කට් මාවත, කොළඹ - 10.

තනතුර :

දිනය : 2014/10/25

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ආචාර්ය එච්. විතාල් අඹවත්ත, අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, (දෙපාර්තමේන්තු පුස්තකාලය) ඕල්කොට් මාවත, කොළඹ - 10.

නම : .....

තනතුර : .....

දිනය : 2012.10.26

නිල මුද්‍රාව

යොමු අංකය : 2/1/17/1/4/1

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය (ශිල්ප ප්‍රදර්ශක) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : .....

නම : ඩබ්ලිව්.ඒ. පියවිත්‍රම, අතිරේක ලේකම් (පරිපාලන හා මූල්‍ය), යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, "නිපුණතා පියස", 354/2, ඇල්විටිගල මාවත, කොළඹ - 05.

(ලේකම්)

අමාත්‍යාංශය

දිනය : .....

නිල මුද්‍රාව :

1-D

යොමු අංකය : PSC/EST/3/1/77/2012

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය (ශිල්ප ප්‍රදර්ශක) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2012-10-09 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : [illegible]

නම : .....

(ලේකම්)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 22-11-2012

නිලමුද්‍රාව : .....

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, කාවිල පාර, බාරාසේස්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

කළමනාකරණ සහකාර අධි පන්තියට (ශිල්ප ප්‍රදර්ශක) බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තියට (ශිල්ප ප්‍රදර්ශක) බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

2. ලකුණු ලබාදීමේ ක්‍රමය :

	ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
1	අතිරේක අධ්‍යාපන සුදුසුකම්	25	අදාල නොවේ.
2	තනතුරට අදාලව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම්	35	
3	තනතුරට අදාල ක්ෂේත්‍රය තුළ ලබා ඇති අතිරේක පළපුරුද්ද	35	
4	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය	05	
		100	

3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

4. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අවශ්‍යතාවය පරිදි

සකස් කළේ :

අත්සන : .....

(විෂයභාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරී)

නම : පී. කේ. සරත්චන්ද්‍ර.

තනතුර : පරිපාලන නිලධාරී, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ - 10.

දිනය : 2012/10/25

පරීක්ෂා කළේ :

අත්සන : .....

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)

නම : බී. පී. සී. කලරත්න

තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2012/10/25

අත්සන : .....

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

ආචාර්ය. එච්. පිත්‍රාල අබේවන්න
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,
කොළඹ - 10.

නම : .....

තනතුර : .....

දිනය : 2012.10.26

නිල මුද්‍රාව: .....